IHRA
UNIVERSITY OF COLOMBO

41

## මානව සම්පත් අභිවර්ධන ආයතනය

## කොළඹ විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## ශ්‍රම අධ්‍යාපනවේදී උපාධි පරීක්ෂණය - II කොටස - 2013

(දෙවන සෙමෙස්තරය)

(පවත්වන ලද්දේ 2015 මාර්තු)

# BLE 206 - ශ්‍රම භාවිතයේ ඓතිහාසික පැතිමාන

**අයදුම්කරුවන්ට උපදෙස් :**

(1) ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

(2) කාලය පැය තුනයි. (03)

(3) මෙම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න හතකින් (07) සහ පිටු එකකින් (01) සමන්විත වේ.

(4) පිළිතුරු පත්‍රයේ සියලුම පිටුවල විභාග අංකය යොදන්න.

(5) ප්‍රශ්න පත්‍රයේ යම් පිටුවක් හෝ කොටසක් පැහැදිලිව මුද්‍රණයවී නොතිබේ නම් කරුණාකර වහාම ඒ බව ශාලාධිපතිට දැනුම් දෙන්න.

1. ආගමික සංස්ථා හඳුන්වා දී රාජ්‍යයේ පැවැත්මට ආගම ඉවහල් වූ ආකාරය අනුරාධපුර යුගය ඇසුරින් විමසන්න.

2. අනුරාධපුර වාරිමාර්ග පද්ධතිය ඔස්සේ ගොඩනැගුණු සමාජ සැකැස්ම ශ්‍රම ඵලදායිතාව කෙරෙහි සිදුකළ බලපෑම පිළිබඳ විග්‍රහයක් කරන්න.

3. පැරණි ලංකාවේ ශ්‍රම භාවිතය පිළිබඳව උදාහරණ තුනක් (03) පුරා විද්‍යාත්මක මූලාශ්‍ර ඇසුරින් දක්වන්න.

4. පැරණි ලංකාවේ ජල කළමනාකරණය පිළිබඳ පැවති විශිෂ්ඨතා පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.

5. කුල ක්‍රමය මගින් ශ්‍රී ලංකාවේ ශ්‍රමයේ ඇති විශේෂ ප්‍රාගුණ්‍ය සමාජ-ආර්ථික ප්‍රගමනය සඳහා ධනාත්මක ලෙස භාවිතා කර ඇත. ඔබගේ අදහස් දක්වන්න.

6. බ්‍රිතාන්‍යයන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ ප්‍රදේශ පාලනය සඳහා හඳුන්වා දුන් ද්විත්ව පාලනය කුමක්දැයි උදාහරණ සහිතව සාකච්ඡා කරන්න.

7. (i) කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ සඳහා පසුබිම් වූ මූලික හේතු මොනවාද?

   (ii) කෝල්බෲක්-කැමරන් කොමිෂම නිර්දේශ කළ ආර්ථික ප්‍රතිසංස්කරණ යෝජනා පිළිබඳ විවේචනාත්මක විග්‍රහයක් කරන්න.

~~~~~~
~~~~~~